# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 53 දරන සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1981 අගෝස්තු මස 28 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.


1981 සැප්තැම්බර් මස 04 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : ශත 20 යි.

තැපැල් ගාස්තුව : ශත 50 යි.

**1981 අංක 53 දරන සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1981 අගෝස්තු මස 28 වන දින]

එල්. ඩී.—ඕ. 26/80.

**සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1981 අංක 53 දරන සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

2. සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනතේ, 1957 අංක 60 දරන පනතින් ඇතුළත් කරන ලද 18ආ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— *29 වන අධිකාරයේ 18ආ වගන්තිය සංශෝධනය කිරීම.*

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(1) මේ කොටස අදාළ වන ස්ත්‍රී සේවකයකු විසින්, දැන්වීමෙහි සඳහන් දින සිට දින දහහතරක් ඇතුළත තමා දරු ප්‍රසූතිය අපේක්ෂා කරන බවට දැන්වීමක් තම සේවායෝජකයාට දෙනු ලැබූ විට, ඒ දිනයෙන් ආරම්භ වී ඇගේ දරු ප්‍රසූතියේ දිනයට පෙරාතුව ම වූ දිනයෙන් අවසන් වන කාල සීමාව සඳහා නිවාඩු ලැබීමට (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව ඇයට හිමිකම ලැබිය යුතු අතර, ඇගේ සේවායෝජක විසින් ඒ නිවාඩුව දිය යුතු ය."; සහ

(ආ) එහි (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:—

"(3) මේ කොටස අදාළ වන ස්ත්‍රී සේවකයකු (1) වන උපවගන්තියෙහි සඳහන් දින දහහතරක කාල සීමාව තුළ යම් දින ගණනක් ඇගේ සේවායෝජකට වැඩ කර ඇති අවස්ථාවක, ඇගේ දරු ප්‍රසූතියට පසු, (2) වන උපවගන්තියේ සඳහන් නිවාඩු කාල සීමාව අවසන් වන දිනයට ඉක්බිතිව ම වූ දින සිට ගණන් ගෙන, ඒ දින ගණන සඳහා නිවාඩු ලබා ගැනීමට ඇයට හිමිකම ලැබිය යුතු අතර සේවායෝජක විසින් ඒ නිවාඩුව දිය යුතු ය.".

ඡ—57186—13,875 (81/07)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1. තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත හැම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.